# සහභාගීත්ව සංවර්ධනය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය සිරිසේන තිලකරත්න මහතා සමග කරන ලද පිළිසඳරක් ඇසුරෙන් සකස් කරන ලද්දේ එස්. ආර්. බණ්ඩාර විසිනි.**

**ප්‍රශ්නය :**

*මහාචාර්යතුමනි, "සහභාගීත්ව සංවර්ධනය" යන සංකල්පය බොහෝ කලක් තිස්සේ සංවර්ධන ප්‍රයත්නය සමග සැරිසරමින් පවතිනවා. ඒ පිළිබඳව ඔබගේ අදහස් දැන ගැනීමට "ගොවි ජනතාව" පාඨකයින් ඉතාමත් කැමැත්තෙන් ඉන්නවා.*

**පිළිතුර :**

සහභාගීත්ව සංවර්ධනය යන්න මානව සංවර්ධනය පිළිබිඹු කරන සංවර්ධන සංකල්පයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. මානව සංවර්ධනය යන්න. විග්‍රහ කරන විට එය දෙයාකාරයකින් සමන්විත වෙනවා. එයින්;

* මිනිසාගේ භෞතික අවශයතාවන් ඉටුවීම
* මිනිසාගේ මානව සහ සමාජීය අවශ්‍යතාවන් ඉටුවීම

මිනිසාගේ භෞතික අවශ්‍යතාවන් ඉටු වීම යනුවෙන් අදහස් කරන්නේ ආහාර සහ පෝෂණය, සෞඛ්‍ය, අධ්‍යාපනය, වාසස්ථාන ප්‍රවාහන පහසුකම් යනාදී අවශ්‍යතා ඉටු කර ගැනීමේ හැකියාව ඉහළ යාමයි.

මිනිසාගේ මානව සහ සමාජීය අවශ්‍යතා ඉටුවීම යනුවෙන් අදහස් කරන්නේ තම ආත්ම ගරුත්වය, ආත්මාභිමානය, සාධාරණත්වය, ස්වාධීනතාවය, අනුන්ට ගැති නොවී ස්වයං තීරණ වලට එළඹීමේ හැකියාව වැනි දේ ප්‍රගුණ වීමයි.

"සහභාගීත්ව" යන සංකල්පය පැති දෙකකින් සමන්විත එකක්. එක් පැත්තකින් බලනවිට මෙය එක්තරා **පරමාර්ථයක්**. එනම් **මිනිසාගේ වැදගත් අවශ්‍යතාවක්** ඉටුවවීමක්. අනික් පැත්තෙන් බලනවිට මෙය සංවර්ධනයට යොදා ගත හැකි එක් **උපාය මාර්ගයක්**. සංවර්ධන කටයුතු වලට ජනතා සහභාගීත්වය ලබා ගැනීම එම කටයුත්ත සාර්ථක කර ගැනීමට හේතු භූත වන උපාය මාර්ගයක්.

**ප්‍රශ්නය:**

*"සහභාගීත්වය" යන්න උපයෝගී කර ගන්නේ මෙම ක්‍රියාවලියේ කවර අවස්ථාවල දීද?*

**පිළිතුර :**

සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියකදී "සහභාගීත්වය" යන්න නොකඩවා පැවතිය යුතු ගුණාංගයක්. එය තවදුරටත් විස්තර කරනවා නම්;

- ගැටළු හඳුනා ගැනීමේදී
- ගැටළු වලට අදාළ කරුණු පෙළගැස්වීමේ දී
- ගැටළු වලට හේතු විග්‍රහ කිරීමේ දී
- විසඳුම් පිළිබඳ තීරණ ගැනීමේදී
- විසඳුම් ක්‍රියාත්මක කිරීමේ දී
- ක්‍රියාකාරකම් ඇගයීමේ දී

යන සෑම අවස්ථාවකදීම "සහභාගීත්වය" යන්න ක්‍රියාත්මක වශයෙන් තිබිය යුතු යි. නමුත්, වැඩි වශයෙන්ම දක්නට ලැබෙන අත්දැකීම් අනුව මිනිසුන්ගේ සහභාගීත්ත්වය යන්න බොහෝ විට එක්කෝ යෝජනා සකස් කරන අවධියට නැත්නම් ඒවා ක්‍රියාත්මක කරන අවධියට පමණක් සීමා වී තිබෙනවා. අඛණ්ඩව ක්‍රියාවලියන් හැටියට දකින්න තරම් ප්‍රමාණවත් වන්නේ කලාතුරකින්.

**ප්‍රශ්නය :**

*සාර්ථක සහභාගීත්වයක් බිහි කිරීම සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය ගුණාංග මොනවා ද?*

**පිළිතුර:**

පළමුවන එක "අවබෝධය" එනම්; මුලින්ම ගැටළුවක් තිබෙන බව හඳුනා ගැනීම, ගැටළුවේ ස්වභාවය සහ ඊට හේතු භූත වූ කරුණු හඳුනා ගැනීම.

මේ කරුණු දෙකම එකට සම්බන්ධ කර එයට කියනවා ගැටළුව පිළිබඳ "අවබෝධනය" කියල. මේ අවබෝධනය තියෙනවා නම්, විසඳුම් කුමක් විය යුතු දැයි තීරණය කර ගැනිම ඉතාමත් පහසු වෙනවා. ඒ වගේ ම එම විසඳුම් ක්‍රියාත්මක කරන්නටත්, එය අත්‍යවශයම දෙයකි. ජනතා සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලියක පදනම වන්නේ අවබෝධනයි.

දෙවන කරුණ - සංවිධානය වීමයි. දුප්පත් ජන කොටස් තම ප්‍රශ්න විසඳ ගැනීමට නම් කිසියම් බලයක් බිහි කරගත යුතු යි. එය කළ හැක්කේ සංවිධාන වීම තුළින්. බාහිරයෙන් ඇතුළ් කළ ඒවා නොව ස්වයංසංවිධානයන්ම වීම අත්‍යවශ්‍ය වේ. මෙවැනි ජන කොටස්. අත්දැකීමෙන් ම කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වේ. අන්‍යොන්‍ය විශ්වාසයක් ඇති අය එකට එකතු වී සංවිධානය වේ. කණ්ඩායම කුඩා වූ තරමට සහභාගීත්වයද වැඩිවේ. එහෙත් කුඩා කණ්ඩායමකට කළ හැකි දේවල් පැහැදිලි සීමාවක් ඇත. එබැවින් එක්තර අවස්ථාවකට පසු කුඩා කණ්ඩායම් ඒකාබද්ධවී ලොකු සංවිධාන බිහිකර ගැනීම අවශ්‍ය කරුණක්.

සංවිධානය වීමෙන් කිසියම් බලයක් ගොඩ නැංවීමට මෙන්ම පැහැදිලි සංවර්ධන වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමට ද සාමාජිකයින්ට අවස්ථාව ලැබේ. එනම්, ප්‍රශ්ණ සාකච්ඡා කොට අවබෝධ කර ගෙන ඒවා විසඳා ගැනීමට වැඩ පිළිවෙලක්;

තුන්වන කරුණ- අරමුදල් සහ සම්පත් සපයා ගැනීමයි. මේ සඳහා කුඩා කණ්ඩායම් මුලින්ම කරන්නේ ඉතිරි කිරීමේ අරමුදලක් පිහිටුවා, එදිනෙද ණය අවශ්‍යතා එමගින් සපුරා ගැනීමට උත්සාහ ගැනීමයි. කණ්ඩායම් ලෙස සංවිධාන වූ ජන කොටස් වලට "බාහිර සම්පත් ලබා ගැනීම" ද පහසු කාර්යයක් වේ. උදා: කිසියම් තාක්ෂණික හෝ කෘෂි ව්‍යාප්තිය වැනි සේවා හා ණය පහසුකම් වැනි දේවල් ලබා ගැනීම මෙවැනි සංවිධානවල පහසු වේ. කණ්ඩායමකට පැහැදිලි වැඩ පිළිවෙලක් සම්පාදනය කර ගෙන ක්‍රියාත්මක කළ හැකියි. බාහිරෙන් ලැබෙන සේවා හා සම්පත් පහසුකම් තනි තනිව ලබා ගැනීමට කරන උත්සාහයකදී බොහෝ විට සාර්ථක වන්නේ නැහැ. කණ්ඩායමක් මගින් සංවිධානාත්මකව කරන උත්සාහයන් වඩා සාර්ථක වෙනවා.

අවබෝධනය, සංවිධානය වීම, එසේ සංවිධානය වීම තුළින් අරමුදල් හා සම්පත් ලබා ගැනීම යන ඒවා සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ වේ. වෙනත් විවිධ සංවර්ධන ප්‍රයත්න වලින් මෙය වෙනස් වෙන්නේ ද මේ කරුණු තුනම ඒකාබද්ධව ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාදමය මෙය නිසායි.

කාටවත් ගැති නැතිව .,ආත්ම ගරුත්වයකින් හා විශ්වාසයකින් යුතුව

කටයුතු කිරීම එනම්, තමන්ගේ ස්වාධීනතාවය ආරක්‍ෂාවන අයුරු කටයුතු කිරීම කොට්න්ම මානව සංවර්ධනය සහභාගී සංවර්ධන ක්‍රියාවලියකින් බලාපෙරොත්තු වන වැදගත් ප්‍රතිඵලයක්. එහෙත්, සංවර්ධන කටයුතු වලට සහභාගී වීම තුළින් ආර්ථික වශයෙන් වාසි සැළසෙන්නේ නැත්නම් ජනතාව ඒ තුළ රඳවා ගැනීමට නොහැකියි. එබැවින් සහභාගී වනඅයට ආර්ථික වාසි අත්කර ගත හැකිවීම මෙහි අවශ්‍යම අංගයක් වේ. ආත්ම විශ්වාසය හා ආත්ම ගරුත්වය යන්නත් අර්ථික වාසියත් අතර අන්තර් ක්‍රියා කාරීත්වයක් පවතිනවා. මේ කරුණු දෙක එකකින් අනික වෙන්කර ගන්නට බැරි තරම් එකිනෙකට සමීප ලෙස සම්බන්ධ වී තිබෙනවා.

**ප්‍රශ්නය :**

*මෙවැනි ක්‍රියාවලියක් දියත් කිරීමට අවශ්‍ය දේ මොනවා ද?*

**පිළිතුර :**

පළමුවෙන් අවශ්‍ය වන්නේ සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ කැපවීමකින් ජනතාව සමග ඉතා සමීපව ක්‍රියා කිරීමට සූදානම් සංවර්ධන වැඩකරුවන් පිරිසක්. මොවුන් ජනතාව සමග තිරස්ව විහිදෙන සම්බන්ධතාවයක් බිහි කරගත යුතු යි. මේ දෙපිරිසටම වැදගත් අත්දැකීම් තියෙනවා. ජනතාවට ඉතාවැදගත් අත්දැකීම් තිබෙනවා. නමුත් ඒවා කෙසේ යොදා ගත යුතු ද යන්න ගැන ඒ පිරිසට හරියට තේරුමක් නැති වෙන්න පුළුවන්. අන්න ඒ අවස්ථා වල දී මැදිහත් වන්නන් විසින් ඔවුන්ට අවශ්‍ය දැනීම හා මග පෙන්වීම ලබා දීම වැදගත් වෙනවා. මෙතැන දී ඇත්තෙන්ම සිදු වන්නේ ඒ දෙගොල්ලන්ගේ ම අත්දැකීම් හුවමාරු කර ගැනීමක්,

ඒ ඒ ජන කොටස් වලට අදළ ප්‍රශ්ණ කෙරෙහි ඒ ඒ අයගේ අවධානය යොමු කරවා එම ප්‍රශ්ණ හඳුනා ගන්නට ඉඩකඩ සලස්වා දී ඒවාට විසඳුම් සොයා ගැනීම සඳහා එක්ව සාකච්ඡා කර සංවිධානය කිරීමත් මෙහි දී සිදු වෙනවා. මිනිසුන්ට ආත්ම විශ්වාසයක් මත ගරුත්වයක් ඇති වනආකාරයට තිරස් සම්බන්ධතාවක් දියුණු කිරීම මැදිහත් වන්නන්ගේ වැදගත් කාර්යයක්. මැදිහත් වන්නා විසඳුම් සපයන්නෙකු හෝ නායකයෙකු නොවේ. ඔහුගේ කාර්යය "පුබුදු කිරීම" සහ "පහසු කිරීම" යි.

**ප්‍රශ්නය :**

*මහාචාර්ය තුමනි. සහභාගීත්ව සංවර්ධනය යන්න පූර්ණ ක්‍රියාවලියක් වශයෙන් කොතෙක් දුරට ඇත්ත වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ද?*

**පිළිතුර :**

මේක පූර්ණ ක්‍රියාවලියක් වශයෙන් ක්‍රියාත්මක කිරීම හෝ පවත්වා ගෙන යාම ඉතාමත් අමාරු කාර්යයක්. ප්‍රයෝගික වශයෙන් බොහෝ විට දක්නට ලැබෙන්නේ යම් යම් අංශ වලට පමණක් සීමා වූ සහභාගීත්වයක්, උදහරණයක් වශයෙන්, යෝජනා ක්‍රම සකස් කිරීමේ දී මිනිසුන්ගේ අදහස් විමසනවා; එසේ නැත්නම් යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී මිනිසුන් කිසියම් ආකාරයකින් සම්බන්ධ කරගන්න උත්සාහ ගන්නවා. මේවා අසම්පූර්ණ ක්‍රියාවලීන්.

**ප්‍රශ්නය :**

*මහාචාර්ය තුමනි, එසේ වීමට හේතු වශයෙන් ඔබ දකින්නේ කවර කරුණු ද?*

**පිළිතුර :**

සහභාගීත්ව ක්‍රියාදමය ක්‍රියාත්මක කිරීම යන්නෙන් පිළිබිඹු වන්නේ ජනතාවට තීරණ ගැනීම සඳහා බලය ලබා දීමක්. අනෙක් අය ඊට සහාය වීමත් පමණයි කළ යුතු වන්නේ.

මෙහිදී සැළකිය යුතු වැදගත් කරුන තමයි "බලය" පිළිබඳ ප්‍රශ්නය. ක්‍රියාත්මක කරන බලධාරියා කවුරුත් හෝ වේවා ඔහු/ඇය දේශපාලනඥයෙක් හෝ වේවා පරිපාලකයෙක් හෝ වේවා වෙන යම් කෙනෙක් හෝ වේවා තමන් අත තිබෙන බලය ජනතාවට පැවරීමට කැමති නෑ. මිනිස් ස්වභාවය ඒකයි.

අපට පැහැදිළිව දැකිය හැකි යථාර්තය නම් මේ සංකල්පය ක්‍රියාත්මක වන්නේ "නාමික සහභාගීත්වයක්" වශයෙන් පමණක් බවයි. මේ ප්‍රායෝගික කරණය තරමක් අපහසු දෙයක්. මෙය දේශපාලන, සමාජ හා ආර්ථික යන ක්‍රියාවලින් තුනකින් සැදුනු අන්තර් ක්‍රියාවලියක්. ජනතාව ගේම බලයක් ගොඩ නැංවීම ජනතා සංවිධාන ශක්තිමත්වීම මෙහි වැදගත් ම අංග. නමුත් මේවා පවත්නා සමාජ- දේශපාලන ක්‍රියාවලින් සමග ගැටෙන්න පුළුවන්.

**ප්‍රශ්නය :**

*මහාචාර්ය තුමනි, මේ සහභාගීත්ව සංවර්ධනය සම්බන්ධයෙන් ලංකාවේ අත්දැකීම් සළකා බැලුවහොත් එහි සාර්ථකත්වයක ලකුණු දකින්නට පුළුවන් ද?*

**පිළිතුර :**

ලංකාවේ අත්දැකීම් මේ අංශයෙන් තියෙනවා ක්ෂේත්‍ර කීපයකම, කෘෂිකර්ම, ජලපාලන, ගොවි අලෙවි කටයුතු, නිවාස සංවර්ධන සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජනසවිය වැඩ සටහන මේවායේ සහභාගීත්ව සංවර්ධන සංකල්පයේ යම් අංග දැකිය හැකියි.

මේවායේ ජනතා සහභාගීත්වය සාර්ථක වීම හෝ නොවීම රැඳි පවතින්නේ බලය තිබෙන අය විසින් තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කෙතෙක් දුරට මිනිසුන්ට බලය පවරන්නට සූදනම්ද යන්න මතයි.

"සහභාගීත්ව සංවර්ධනය" යන්න සංකල්පයක් වශයෙන් උතුම් වුනාට මෙය බෙහෝවිට නාමිකව පමණක් පවතින සංකල්පයක්. මිනිසුන් ආත්ම විශ්වාසය කින් ආත්ම අභිමානයකින් යුතුව කිසි කෙනෙකුට ගැති නොවී ස්වාධීන දියුණුව කරා ගෙන යාම තමයි මෙයින් කරන්නේ. මෙය "ස්වීය සංවර්ධනය" යනුවෙන්ද හඳුන්වනවා. ඊට තිබෙන බාධාව බලය පිළිබඳ ප්‍රශ්න යයි. ජනතාවට බලය පැවරීමට බලධාරින් කොතෙක් දුරට සූදනම් ද යන්න මත සාර්ථක අසාර්ථක භාවය රැඳී පවතිනවා.

**ප්‍රශ්නය :**

*"සහභාගිත්ව සංවර්ධනය" යන සංකල්පයේ ප්‍රභවය පිළිබඳව යමක් දැනගන්නට පුළුවන් ද?*

**පිළිතුර :**

මෙය "සමුපකාරය" යන සංකල්පය ප්‍රවර්ධනය වීමෙන් සැදුණු එකක්. මේ පිළිබඳ මූලික ලක්‍ෂණ ඇතුළත් වූ ක්‍රියාවලින් විශේෂයෙන් ආසියාතික රටවල රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කර තිබෙනවා. මෙය තවමත් ඉතා සුළු වශයෙන් ක්‍රියාත්මක වන දෙයකි. ඒ කියන්නේ ග්‍රාමීය, ප්‍රාදේශය වැනි මට්ටමේ සංවිධාන තුළින් මේ "සහභාගීත්ව සංවර්ධන" සංකල්පය ක්‍රියාත්මක වෙලා තියෙනවා. නමුත් මේ සුළු පරිමාණයට ගැලපෙන දේවල් මහා පරිමාණයට කරගෙන යන්න ගියාම ප්‍රශ්ණ මතු වෙනවා. ග්‍රාමීය වශයෙන් සාර්ථකව කෙරෙන වැඩ පිළිවෙල වල් ජාතික වශයෙන් හෝ මහා පරිමාන වශයෙන් කරන්නට යෑමේ දී ගුණාත්මක වශයෙන් පිරිහීමක් ඇති වෙනවා.

සහභාගී සංවර්ධන ක්‍රියාවලින් හා පරිමාණ වශයෙන් ක්‍රියාත්මක වන අත්දැකීම් ඉතා දුර්ලභයි. බොහෝ විට සිදු වන්නේ සහභාගීත්වයේ යම් යම් තෝරාගත් ගුණාංග පමණක් සංවර්ධන ක්‍රියාවලියට ඇතුල් කිරීමයි. මේවා බොහෝ විට අසම්පූර්ණ ක්‍රියාවලීන්.